**දේශීය ණය හා සංවර්ධන අරමුදල - 2014**

------------------------------------------------------------

දේශීය ණය හා සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා රඳවාගත් ඉපැයුම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ අභිතකර විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අභිතකර විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණවත් ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2 මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 අහිතකර විගණන මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූල වීම

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පතු මත පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

---

(i) ප්‍රමිතියේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම එය භාවිතය සඳහා ලබාගත් අවස්ථාවේදී සිට ආරම්භ කළ යුතු වුවද, ප්‍රමිතියේ විධිවිධානවලට පටහැනිව අරමුදලේ වත්කම් මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය කර තිබුණි.

(ii) ප්‍රමිතියේ 79 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වලට අදාළ රු.1,023,128 ක දළ ධාරණ අගය සටහනක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල විසින් එහි ස්ථාවර තැන්පතු මත පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු.9,551,435 කින් හා 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී රු.24,966,196 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පොලී බැර කරන අවස්ථාවේදී රු.1,280,877 ක රඳවාගැනීමේ බදු හා රු.492,161 ක මතිමාත්‍ර බදු නොසලකමින් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම ශුද්ධ පදනම මත මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.1,773,038 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පරිගණක හා කාර්යාල උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කර ආදායම් ප්‍රකාශනයට අයකර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ සමාලෝචිත වර්ෂය අවසානයට දේපල, පිරියත හා උපකරණ (PPE) වටිනාකම රු.906,423 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ පරිගණක දෘඩාංග හා මෘදුකාංගවලට එකතුකිරීමක් ලෙස රු.2,349,238 ක මුදලක් දේපල, පිරියත හා උපකරණවලට සාවද්‍යව හරකර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා අරමුදල විසින් කරන ලද බැර සටහනේ විස්තර මෙම වාර්තාවේ දිනය දක්වාත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණවල නිවැරදිභාවය හා විශ්වාසවන්තභාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඉ) 2012 වර්ෂයේදී පොදු ලෙජරයට සටහන් කරන ලද රු.3,586,139 ක් වූ දේශීය ණය හා සංවර්ධන අරමුදලේ නවීකරණය කරන ලද වත්කම්, ලී බඩු හා සවිකිරීම්වලට එකතුකිරීම් ලෙස 2014 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. තවද, කාර්ය මණ්ඩල පුහුණු වියදම් රු.958,169 ක් ද ලී බඩු හා සවිකිරීම් යටතේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා මුළු වත්කම් හා ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.4,544,308 කින් හා රු.1,020,841 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අයකරන ලද නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියට (UDLIHP) අදාළ ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලී පිළිවෙලින් රු.1,216,741 ක් හා රු.1,306,001 ක් 2013 වර්ෂයේදී ලැබී තිබුණි. කෙසේ වුවද, මෙය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.19,500,745 ක මුදලක් ජංගම වත්කම් යටතේ මුදල් ශේෂයක් ලෙස මෙන්ම ජංගම වගකීම් යටතේද දක්වා තිබුණි. මෙම ශේෂ හඳුනා ගැනීමට හා සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) විගණනයට ඉදිරිපත් කරන ලද ණය උපලේඛනය අනුව, දඹුල්ල මහ නගර සභාවෙන් සහ මහනුවර මහනගර සභාවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී පිළිවෙලින් රු.17,929,308 ක් හා රු.21,948,185 ක් විය. කෙසේ වුවද, මෙම ශේෂ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

### 2.2.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 වර්ෂයේ සිට අරමුදල අඛණ්ඩව පාඩු ලබමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකමෙහි සැලකිය යුතු පිරිහීමක් ඇති වී තිබුණි. මහා භාණ්ඩාගාරයේ සහායක් නොමැතිව අඛණ්ඩ පැවැත්ම සඳහා අරමුදලේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරවන මෙම කරුණ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් දක්වයි. තවද, මෙම කරුණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකරයි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂ වටිනාකම හා විගණනයට ඉදිරිපත් කරන ලද අනුරූපී වාර්තා අතර රු.700,805,504 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂ සහ හානිකරණ ප්‍රතිපාදනය සඳහා සලකා ඇති ණය ශේෂ අතර රු.1,996,692,218 ක වෙනසක් නිරීක්ෂණය විය. වෙනස සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඇ) ලැබුණු සනාථ කිරීම් අනුව, 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද මුළු ආයෝජනය රු.70,454,440 ක් විය. කෙසේ වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.59,230,275 ක් ලෙස දක්වා තිබුණි. රු.11,224,165 ක් වූ වෙනස සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) බැංකු සනාථ කිරීම් අනුව, 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම් තැන්පතුවල ශේෂය රු.43,502,811 ක් විය. කෙසේ වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.99,097,477 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු රු.55,594,666 කින් වෙනස් වී තිබුණි.

(ඉ) ලැබුණු තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලී රු.5,784,198 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.117,095,177 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් එම වටිනාකම් දෙක අතර රු.111,310,979 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------------------

නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය සියයට 10 සිට සියයට 6 දක්වා අඩුකිරීම සඳහා 2014 ඔක්තෝබර් 03 දින කොමසාරිස් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට රු.617,697,468 ක් වටිනා ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අරමුදල විසින් ඒ අනුව පියවර ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 134 ක බදු පූර්ව ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව රු.මිලියන 246 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 112 ක හෙවත් සියයට 45 ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා සමඟ සැසඳීමේදී රු.32,535,852 කින් හෙවත් සියයට 24.7 කින් ශුද්ධ පොලී ආදායම වැඩිවීම සහ රු.48,219,301 කින් හෙවත් සියයට 33.2 කින් සහ රු.55,060,150 කින් හෙවත් සියයට 22 කින් පිළිවෙලින් හානිකරණය හා ක්‍රමක්ෂය අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

එසේම සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අගය එකතු කිරීම රු.115,324,361 ක සෘණ අගයක් දක්වා තිබූ අතර එය ඉකුත් වර්ෂයේදී ද රු.233,530,390 ක සෘණ අගයක් වී තිබුණි. එබැවින්, පෙර වර්ෂයට සාපේක්ෂව අගය එකතු කිරීම රු.118,206,029 කින් වැඩි වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

------------------------------------

ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාතය | 2014 | 2013 |
| --- | --- | --- |
| මුළු ආදායමට ශුද්ධ පාඩුව (ප්‍රතිශතය) | 39.07 | 73.75 |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 23.19 | 16.7 |

ඉහත ගණනය කිරීම් අනුව, ආදායමට ශුද්ධ පාඩුව සමාලෝචිත වර්ෂයේදී සියයට 34.68 කින් සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1993 අංක 24 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනතේ 5 වගන්තිය අනුව අරමුදල විසින් ලබාදෙනු ලබන ණය සඳහා අරමුණ මහජන උපයෝගීතාවය පිළිබඳ කිසියම් කාර්යයක් සඳහා ලබාදීම වන අතර තාක්ෂණික සහාය ඇතුලු වගකීම භාරගැනීම කෙරෙහි එම අධිකාරිය නීතිය මඟින් අනුමත කෙරේ. ඒ අනුව අරමුදල විසින් වර්ග 05 ක් යටතේ ණය ලබා දී තිබූ අතර 2014 වර්ෂය හා ඉකුත් වර්ෂය අවසානයට හිඟ ශේෂය පහත පරිදි වේ.

| වර්ගය | හිඟ ණය ශේෂය | |
|---|---|---|
| | 2014 දෙසැම්බර් 31 දිනට | 2013 දෙසැම්බර් 31 දිනට |
| | රු. | රු. |
| දේශීය ණය හා සංවර්ධන අරමුදල | 816,654,556 | 638,603,693 |
| නාගරික සංවර්ධනය හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 1,711,357,137 | 1,761,718,573 |
| පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 1,694,276,103 | 1,810,665,745 |
| නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය | 67,847,623 | 69,356,658 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 8,717,505 | 9,215,880 |
| එකතුව | 4,298,852,924 | 4,289,560,549 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, නාගරික සංවර්ධනය හා අඩු ආදායම් නිවාස සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යන වර්ග යටතේ 2013 වර්ෂයේදී හා 2014 වර්ෂයේදී පිළිවෙලින් සියයට 83 කට හා සියයට 79 කට වැඩි ප්‍රමාණයක මූල්‍ය පහසුකම් අරමුදල විසින් ලබා දී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන හිඟ ණය ශේෂ රු.මිලියන 2,335.23 ක් වූ අතර එහි රු.මිලියන 1,402.53 ක හිඟ ප්‍රාග්ධන ශේෂ හා රු.මිලියන 932.70 ක හිඟ පොලී ශේෂ අඩංගු වේ. විස්තර පහත දැක්වේ.

| ණය වර්ගය | ආරම්භක ණය | ප්‍රාග්ධන හිඟය | පොලී හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 492.12 | 484.99 | 135.77 | 620.76 |
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 32.25 | 31.73 | 2.43 | 34.16 |
| නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය | 12.00 | 12.00 | 17.93 | 29.93 |
| නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 919.45 | 873.81 | 776.57 | 1,650.38 |
| | 1,455.82 | 1,402.53 | 932.70 | 2,335.23 |

(i) 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය පොලී වලින් පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය හා නාගරික සංවර්ධන හා අඩු ආදායම් ව්‍යාපෘතියේ ණය සඳහා අදාළ හිඟ පොලී පිළිවෙලින් සියයට 22 ක් සියයට 60 ක් හා සියයට 47 ක් විය.

(ii) ඉහත හිඟ ණය ශේෂවලට අදාළ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(iii) නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දඹුල්ල ප්‍රාදේශීය සභාවට ලබාදුන් රු.12,000,000 ක ණය 2010 දෙසැම්බර් 31 දිනට නිරවුල් කළ යුතු විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් එක් වාරිකයක් හෝ අරමුදල විසින් අයකරගෙන නොතිබුණි.

**4.2 කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද රු.3,286,729 ක් වටිනා ගොඩනැගිලි අලුත්වැඩියා කොන්ත්‍රාත්තුවට අදාළව අරමුදල විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත සඳහන් අවශ්‍යතාවයන් අනුගමනය කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (අ) | 2.8.1 (අ) මාර්ගෝපදේශය | - එක් සාමාජිකයෙකුට ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකෙහිම කටයුතු කළ නොහැකි නමුත් එක් පුද්ගලයකු කමිටු දෙකෙහිම සාමාජිකයකු ලෙස පත්කර තිබුණි. |
| (ආ) | 5.2.1 මාර්ගෝපදේශය | - සාර්ථක ලංසුකරුවකුට ලංසු ලියකියවිලි පිළියෙල කිරීම සඳහා අත්‍යවශ්‍ය සියලු අදාළ තොරතුරු ලංසු ලියකියවිලි මඟින් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, මෙම කාර්යය සඳහා නිකුත් කරන ලද ලංසු ලියකියවිලිවල ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව දක්වා නොතිබුණි. |
| (ඇ) | 5.3.1 හා 5.3.5 (අ) මාර්ගෝපදේශ | - ලංසු කැඳවීම සඳහා සම්මත ලංසු ලියකියවිලි භාවිතා කර නොතිබූ අතර ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය ලංසු ලියකියවිලිවල සඳහන් කර නොතිබුණි. |
| (ඈ) | 6.1.4 මාර්ගෝපදේශය | - ලංසු ලියකියවිලි නිකුත් කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් අරමුදල විසින් තබා ගෙන නොතිබුණි. |
| (ඉ) | 8.13.3 මාර්ගෝපදේශය | - සාමාන්‍යයෙන් විචලනයන් හා අසම්භාව්‍ය ප්‍රතිපාදන ඇස්තමේන්තු කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක් නොඉක්මවිය යුතුය. කෙසේ වුවද, මෙම කොන්ත්‍රාත්තුවට අදාළව සියයට 107 ක විචලනයක් නිරීක්ෂණය විය. |

**4.3 මානව සම්පත් කළමනාකරණය**

---

1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව, පුරප්පාඩු තනතුරක රාජකාරී ආවරණය කිරීම මාස 03 ක කාලයකට සීමා විය යුතුය. කෙසේ වුවද, අරමුදලේ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී සහ සහකාර ගණකාධිකාරී 2014 වර්ෂයේ සිට වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබුණි.

**4.4 කළමනාකරණ කාර්යයන්**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු වලින් ලැබුණු සනාථ කිරීම්වලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් රු.43,502,810 ක මුදලක් බැංකු ගිණුමක පවත්වා ගෙන ගොස් තිබුණු අතර එම ගිණුමේ 2014 ජනවාරි 01 දිනට ශේෂය රු.158,587,835 ක් විය. ඒ අනුව විධිමත් ආයෝජන ප්‍රභවවල අතිරේක අරමුදල් ආයෝජනය කිරීම මඟින් උපරිම ආදායම ලබාගැනීම සඳහා අරමුදල විසින් එහි මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) අරමුදල විසින් රජයෙන් ලැබී තිබුණු ප්‍රදාන හා අරමුදල විසින් ලබා දී තිබූ ප්‍රදානයන් විශේෂිත ක්‍රමයක් යොදා ගනිමින් ක්‍රමක්ෂය කර තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රමවේදය සඳහා කොමසාරිස් මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 අයවැය ලේඛනමය පාලනය**

---

කාර්යාල ගොඩනැගිල්ල, පුස්තකාලය හා අනුස්මරණ ශාලා ඉදිකිරීම සහ වෙනත් ආදායම් ජනනය කරන ව්‍යාපෘති ඇතුළත් කාර්යයන් 2 ක් සඳහා අරමුදල විසින් රු.මිලියන 85 ක් ඇස්තමේන්තු කර තිබුණද, එම කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර හෝ නොතිබුණි. ඒ අනුව, අයවැය ඇස්තමේන්තුවේ වෙනත් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘතිවලට වෙන්කරන ලද අරමුදල් උපයෝජනය කර තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

---

අරමුදලේ අභ්‍යන්තර විගණන කාර්යයන් ආවරණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක පත්කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි. 2011 වර්ෂයේ සිට අරමුදල විසින් අඛණ්ඩ පාඩු ලබා ඇති බැවින් හා 2014 දෙසැම්බර් 31 දිනට සෘණ ශුද්ධ වත්කම් රු.939,752,302 ක් පවතින බැවින් අරමුදලේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ණය ශේෂවල පැහැදිලි නොකරන ලද වෙනස්කම් අවමකර ගැනීම සඳහා අරමුදල විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) ණය ලිපිගොනු පවත්වා ගැනීම. | අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීමෙන් තොරව ණය ලිපිගොනු පවත්වා ගැනීම. |
| (ඇ) අක්‍රීය ණය | සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තා කරන ලද අක්‍රීය ණය ශේෂ අයකර ගැනීම සඳහා දැඩි ක්‍රියාමාර්ග නොගැනීම. |